**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (සංරචක -1 පළාත් කොටස) - 2021**
--------------------------------------------------------------------------------------------

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (සංරචක -1 පළාත් කොටස) ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර, 2018 ජුලි 25 දින එළඹී අංක 6228 එල්කේ දරන ණය ගිවිසුමේ ප්‍රතිපාදන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය පළාත් සම්බන්ධීකරණ අමාත්‍යාංශය වන අතර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ නවය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 15,505කට සමාන එ.ජ.ඩො මිලියන 100ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජුනි 30 දින වනවිට අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකිම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ. මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ රැස්වීම් මාස 02කට වරක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 01ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් ප්‍රකාශ කර නොමැත. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් චක්‍රලේඛ උපදෙස් අනුව පැවැත්විය යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විගණන සහ කළමනාකරණ කමිටුව වර්ෂයකට 4 වතාවක් රැස්වීම සඳහා අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්විය යුතුය. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුවක් පැවැත්වීමට යෝජනා කරන ලදී. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය යටතේ වියපැහැදම් සම්බන්ධ දර්ශක (ඩීඑල්අයි) 09ක් සාක්ෂාත් කර ගත යුතු වුවද, 2021 අවසානය වන විට ළඟා කර ගත යුතු ඉලක්ක විගණනයට ඉදිරිපත් කර නොමැති බව ප්‍රගති විස්තර අනුව දක්වා තිබුණි. | ඩීඑල්අයි මනිනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි. එබැවින් මේ සම්බන්ධ තොරතුරු හා වගකීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක් වේ. | විගණක විසින් ඉල්ලා සිටින ඩීඑල්අයි ප්‍රගති වාර්තා සහ අනෙකුත් තොරතුරු ලබා දී ඇති කාල සීමාව තුළ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සංවර්ධන අරමුණු හතරක් (පීඩීඕ) හඳුන්වා දී තිබුණද, ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | විගණක විසින් ඉල්ලා සිටින පීඩීඕ ප්‍රගති වාර්තා සහ අනෙකුත් තොරතුරු ලබා දී ඇති කාල සීමාව තුළ ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය/ උපයෝජනය නොකළ/ඌන උපයෝජිත සම්පත්

| අංකය | නිෂ්කාර්ය වත්කම් | නිෂ්කාර්ය කාලය වර්ෂ | දරන ලද පිරිවැය රු. මිලියන | හේතුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ගිරිබාව මධ්‍ය මහා විද්‍යාලයේ ගුරු නිවාස (වයඹ පළාත) | වර්ෂ 1 | 1.09 | සඳහන් කර නොමැත | ඩීඑල්අයි 5-(නව වෘත්තීය සුදුසුකම්ලත් ගුරුවරුන් ප්‍රමාණය වැඩි කිරීම) අනුව ගෙවීම් සිදු කර ඇත. | නිල නිවාස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | වාරියපොල අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේ ඉංග්‍රීසි සහ ගණිත ඉගෙනුම් මධ්‍යස්ථානය | වර්ෂ 1 | 53 | (i) අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයට භාරදීමේ ප්‍රමාදය.<br>(ii) විදුලිය හා ජලය කාර්යාලීය උපකරණ, ඉගෙනුම් උපකරණ නොමැති වීම සහ පරිශ්‍රයට ප්‍රවේශවීම සකස් කර නොමැති වීම. | උපකරණ සපයන අතර විශාල ප්‍රමාණයේ විදුලි සැපයුමක් භාවිතා කිරීමට කටයුතු යොදා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව පුහුණු මධ්‍යස්ථානය අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගැටලු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| උපදේශකයින් සේවයේ යෙදවීමේ සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 (i), 4.3 සහ 4.4 ඡේදවල සඳහන් විධිවිධානවලට පටහැනිව 2021 වර්ෂයේදී උපදේශකවරුන් වෙත රු. මිලියන 8 ක වැටුප් ගෙවා ඇති අතර බඳවාගත් උපදේශකයින් ව්‍යාපෘතියට අදාළව ප්‍රමාණවත් සේවාවක් ඉටු කර ඇති බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | උපදේශකයින් සේවයේ යෙදවීමේ සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි කිසිවක් සිදුවී නොමැති බව දන්වා සිටීමට කැමැත්තෙමි. අවශ්‍ය අවස්ථාවේදී ගෙවන මුදලට සාපේක්ෂව මෙම නිලධාරීන්ගෙන් මා හට විශාල සේවයක් ලැබුණු බව සඳහන් කිරීමට කැමැත්තෙමි. | අනවශ්‍ය තනතුරු අහෝසි කර ඒ අනුව රජයේ වියදම් අඩු කළ යුතුයි. |

### 3.4 ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට ඇති මුළු මුදල රු. මිලියන 9,773කට සමාන එ.ජ.ඩො මිලියන 49.36කි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,888ක් පමණක් වැයකර තිබුණි. ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය සියයට 19.32ක් විය. | අදහස් දක්වා නොමැත. | ප්‍රමාදයන් ආවරණය කිරීමට ක්‍රියාත්මක කරවීමේ ආයතන විසින් පියවර ගත යුතුය. |

### 3.5 පද්ධති සහ පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම අරමුදල් ලැබී තිබුණද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අවශ්‍ය මූලික පොත්පත් සහ ගිණුම් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික ගිණුම් පොත් නිසි පරිදි පවත්වාගෙන යන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | පොත්පත් සහ ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 19.51ක පිරිවැයකට මිලදී ගත් ඩෙස්ක්ටොප් පරිගණක 120ක් පාසලකට 6 බැගින් පාසල් 20 වෙත භාර දෙන ලදී. කෙසේවෙතත්, එම පරිගණක පාසල් වෙත ලැබී ඇත්ද යන්න තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොමැත. | අදහස් දක්වා නොමැත. | වාර්තා නිසිපරිදි තබා ගත යුතු අතර ඉල්ලා සිටින විට විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පාසලේ සිසුන් සංඛ්‍යාව අනුව සමාලෝචිත වර්ෂයේදී පාසල් 860ක් සඳහා රු. මිලියන 52.75ක් ලබා දී තිබුණි. ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මගින් අදාළ පාසල් වෙත එම මුදල් බෙදා දී තිබුණි. කෙසේවෙතත්, ඌව පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය එම අරමුදල් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කිරීම සඳහා යොදවන්නේ දැයි පරීක්ෂා කර නොතිබුණි. | මාර්ගෝපදේශ සහ ආකෘති හරහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ප්‍රගතිය සමාලෝචනය කර ඇත. | වගකිව යුතු පාර්ශවයන් විසින් කාලීනව පසු විපරම් කටයුතු සිදු කළ යුතුය |